# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

**කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය**
**மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு**
**Ministry of Women, Child Affairs and Social Empowerment**


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/SW/14/19/01/Circular | ඔබේ අංකය / உமது இல / Your No: | දිනය / திகதி / Date: 2022/07/26 |

**සියළුම දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,**
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,
ප්‍රාදේශීය ලේකම්,
දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ/ දිස්ත්‍රික් සමෘද්ධි සහකාර අධ්‍යක්ෂ,
සමෘද්ධි කළමනාකරුවන්/ ප්‍රවර්ධන නිලධාරී/ සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වෙත.

**<u>සමෘද්ධි සහනාධාර වටිනාකම් සංශෝධනය කිරීම.</u>**

මාගේ සමාංක හා 2022/03/02 දිනැති ලිපිය මඟින්, 2022 අප්‍රේල් මස සිට ලබාදී ඇති උපරිම මුදල් සීමා යටතේ සමෘද්ධි සහනාධාර සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය තාවකාලිකව අත්හිටුවන ලෙස උපදෙස් ලබා දී ඇත. අප අමාත්‍යාංශ ලේකම් සමඟ සාකච්ඡා කර ගන්නා ලද තීරණයකට අනුව එම චක්‍රලේඛය නිකුත් කරන ලදි. තවද, 2021/03/29 වන දින සහ 2022/03/10 දින අංක DSD/HO/SW/14/19/01/Circular දරන **ආර්ථික වශයෙන් ශක්තිමත් වූ ප්‍රතිලාභීන් සහිත සමෘද්ධි සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම - 2022** යන මැයෙන් මා විසින් නිකුත් කර ඇති ඉහත සංශෝධනයට අදාළ උපදෙස් මාලාව අනුව සහනාධාර වටිනාකම් සංශෝධනයට උපදෙස් ලබා දී තිබූ අතර, 2022/03/02 ලිපිය මඟින් ලබා දී තිබූ උපදෙස් අනුව ඉහත සහනාධාර සංශෝධනය කිරීම සියළුම දිස්ත්‍රික්වල නැවත දැනුම් දෙනතුරු නවතා දමන ලදී.

02. ඇතැම් දිස්ත්‍රික්ක දැනට සහනාධාර ලබන පවුල් සමූහ වශයෙන් සංශෝධනය කර සහනාධාර ඉවත් කිරීමේ කටයුතු සිදු කරන බවට මා වෙත වාර්තා වී ඇත. එසේ හෙයින් අදාළ පාර්ශව සමඟ සාකච්ඡා කර ජාතික මට්ටමින් මෙලෙස සහනාධාර සංශෝධනයට ලිඛිත උපදෙස් ලබා දෙනතෙක් ඔබ දිස්ත්‍රික්කය තුළ සහනාධාර සමූහ වශයෙන් සංශෝධනය කිරීමක් සිදුවන්නේ නම් එම කාර්ය තාවකාලිකව අත්හිටුවන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

03. නමුත් වර්තමානයේ රට තුළ වන ආර්ථික අර්බුදකාරී තත්වය මත එදිනෙදා ජීවිකාව කරගෙන යාමේ ගැටළුවකට මුහුණ දී ඇති බැවින් විශාල වශයෙන් අඩු ආදායම්ලාභී සමෘද්ධි සහනාධාරලාභීන් සහනාධාර වැඩ පිළිවෙලින් ඉවත් කිරීම සුදුසු නොවේ. මෙම කාලසීමාව තුළ ලෝක බැංකු ආධාර


**1වන අදියර.4 වන මහල. සෙත්සිරිපාය. බත්තරමුල්ල. /1ம் கட்டம். 4 வது மாடி.செத்சிறிபாய பத்தரமுல்ல /1st Step. 4 th floor. Sethsiripaya**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

තුලින් මුදල් සහන ලබා දෙන අතර, ලෝක බැංකුව හා මහා භාණ්ඩාගාර පාර්ශවයෙන්ද මෙම අවස්ථාවේ විශාල ලෙස සහනාධාර සංශෝධනය කිරීම නුසුදුසු බවට කරුණු අනාවරණය කර ඇත.

04. මෙම සංශෝධන සඳහා ඉදිරියේදී ක්‍රමවත් හා සංවිධානාත්මකව එම වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිව ඇති බැවින් මේ අවස්ථාවේ එවැනි සහනාධාර සංශෝධනයක් සිදු කිරීම තාවකාලිකව අත්හිටුවන ලෙස කාරුණිකව දන්වමි.

05. එහෙත්, ස්ථිර රැකියා හිමිවීම, සිය කැමැත්තෙන්, සහ මියයාම වැනි කරුණු මත සමෘද්ධි සහනාධාරය ලබා ගැනීම අත්හරින ප්‍රතිලාභීන්ට එම අවස්ථාව ලබාදීමට හැකියාව ඇති බවද වැඩිදුරටත් සඳහන් කරමි.

**ආර්.පී.බී.තිලකසිරි**
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

| | | |
|---|---|---|
| 01. | ලේකම්, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය | - කා.දැ.ගි. |
| 02. | ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - අ.ක.ස. හා කා.දැ.පි. |
| 03. | ප්‍රධාන අභ්‍යන්තර විගණක | - අ.ක.ස. |
| 04. | සියළුම අංශ ප්‍රධානීන් | - අ.ක.ස. |